සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 03 |

උපදෙස් :
* පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

## II කොටස

1. (i) භෞතික ජීවන පරිසරයට අයත් මූලික කොටස් **දෙකක්** නම් කරන්න
   (ii) **"ප්‍රතිරෝධය"** හඳුන්වන්න.
   (iii) ප්‍රෝටීන ශක්ති මන්දපෝෂණයෙහි, ආකාර **දෙක** නම් කරන්න.
   (iv) පෘථිවිය මත සුලබවම දැකිය හැකි කාබනික අණුව කුමක්ද?
   (v) මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන විශේෂිත කෙඳි වර්ග **දෙකක්** නම් කරන්න.
   (vi) රෝලර් මුද්‍රණය හඳුන්වන්න.
   (vii) සංචාරක ආකර්ෂණ මූලධර්ම හඳුන්වන්න.
   (viii) **"සම්පත් අවභාවිතය"** යන්න හඳුන්වන්න.
   (ix) **"සංකාසනය"** යනු කුමක්ද ?
   (x) පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **දෙකක්** නම් කරන්න.

**( මුළු ලකුණු 2 x 10 = 20)**

2. (i) සංකල්පය යන්න හඳුන්වන්න. (ලකුණු 03)
   (ii) අභ්‍යන්තර අවකාශ නිර්මාණයේදී පොළොව සඳහා අමුද්‍රව්‍ය තේරීමේදී සැලකිය යුතු කරුණු **තුනක්** නම් කරන්න. (ලකුණු 04)
   (iii) අප ජලය උත්පාදනය වන මූලාශ්‍ර දක්වා, ඒවා බැහැර කළ යුතු ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 04)
   (iv) විදුලි උපකරණ භාවිතයේදී ප්‍රශස්ත ලෙස භාවිතා කළ යුතුය. පැහැදිලි කරන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 16)**

3. (i) ආහාර විෂ වීම බහුල වශයෙන් සිදුවනුයේ අහිතකර ක්ෂුද්‍ර ජීවීන් ආහාර සමග මුසුවීමෙනි. නිදසුන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

   (ii) අධි රුධිර පීඩනය පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 04)

   (iii) සීනි හා මේදය ආහාර පිරමීඩයේ ඉහළින්ම දක්වා ඇත. පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (iv) ස්ථූලතාවයෙන් පෙළෙන පුද්ගලයෙකු සඳහා දිනක බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 16)**

4. (i) ආහාර ආසාදනය යන්න හඳුන්වා ඊට නිදසුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

   (ii) ආහාරයේ ජල ප්‍රමාණය පාලනය කිරීමේ ක්‍රමයක් වන ආස්‍රැති විජලනයේ මූලධර්මය පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (iii) රික්ත ඇසුරුම්කරණය විස්තර කරන්න. (ලකුණු 04)

   (iv) A - ලැක්ටික් අම්ල පැසවීම මඟින් කිරි පරිරක්ෂණය කිරීමේ ක්‍රමයක් නම් කරන්න.
   B – ඉහත සඳහන් ක්‍රමයේ පළමු පියවර හතරක් අනුපිළිවෙලින් දක්වන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 16)**

5. (i) ගෘහ පිළි සහ ඇඳුම්වලට අමතරව භාවිත වන වෙනත් රෙදිපිළි නම් කරන්න. (ලකුණු 03)

   (ii) නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක සිදු කෙරෙන ක්‍රියාවලියේ විවිධ පියවර පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 04)

   (iii) රෙදි මතුපිට මෝස්තර ගැන්වීමේ ක්‍රමයක් වන **"ගැට පඬු"** ක්‍රමය හඳුන්වන්න. (ලකුණු 04)

   (iv) නොවියන ලද රෙදි නිෂ්පාදනයේදී, බැඳීම සහ ලැමිනේටින් කිරීම හඳුන්වන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 16)**

6. (i) ආහාර පිසීමේදී පිටවන විමෝචක අඩු කිරීම සඳහා ගත හැකි පියවර **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

   (ii) අපද්‍රව්‍ය කළමනාකරණයේදී භාවිතා කරන සංකල්පයක් නම් කර එය පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (iii) සංචාරක කර්මාන්තයේ කාලීන ප්‍රවණතා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

   (iv) සංචරණය මඟින් පුද්ගලයාට ලැබෙන ප්‍රතිලාභ දක්වන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 16)**

7. (i) නව යෞවනයා මුහුණ දෙන ගැටලු වර්ග කළ හැකි ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න.
(ලකුණු 04)

(ii) නව යෞවනයන් මුහුණ දෙන පවුල ආශ්‍රිත ගැටලු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නව යෞවනයාට සමාජයෙන් ලැබෙන අත්දැකීම් ජීවිත කාලය පුරාවටම බලපානු ඇත. එම අත්දැකීම් ලබා ගැනීමට ඔහු ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) යොවුන් දරුවකු තුළ ස්ව සංකල්පය වර්ධනය කිරීමට වැඩිහිටියන් ක්‍රියා කළ යුතු ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 16)**

8. පහත දැක්වෙන මාතෘකා අතරින් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) ක්‍රියානුරූපී බව.
   (ii) ආහාර දුඹුරු පැහැගැන්වීමේ ප්‍රතික්‍රියා.
   (iii) කෙඳි පිළිස්සීම.
   (iv) සෞඛ්‍ය සංවරණය.
   (v) නිරෝගී මනසක් ඇති පුද්ගලයකුගේ ලක්ෂණ. **(ලකුණු 4 x 4 = 16)**